**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**
**පාසල් මට්ටම**

| | |
|---|---|
| **9 ශ්‍රේණිය** | **භාෂා භාවිතය හා අවබෝධය** |
| | **කාලය පැය .යි 02** |

**1 හා 11 කොටස්වල සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1)පහත සඳහන් වාක්‍යවල සදොස් අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා එම පදය පමණක් තිත් ඉර මත ලියන්න.

1. ගුරුවරු ත්‍යාග ප්‍රධානය හා එක් වෙති.

2. මෙම පද්‍යයේ අරුථ කුමක් ද?

3. මම ඔබට දීර්ගායුෂ ප්‍රාර්ථනා කරමි. (ල. 9)

(2) වරහන් තුළ ඇති අතුරින් සුදුසු පද තෝරා හිස්තැන් පුරවන්න.

(හරවත් රසඥතාව අනන්‍ය)

1. සිංහල හා දෙමළ ජනයා ඔවුන්ට .......................... වූ චාරිත්‍රවාරිත්‍ර ඉටු කරමින් අවුරුදු උත්සවය සමරති.

2. උතුම් චරිත හැදෑරීමෙන් ............................ජීවිතාදර්ශ ලබා ගත හැකි ය.

3. නිර්මාණය මෙන් ම .......................... බොහෝ විට සහජයෙන් උරුම වන්නකි. (ල. 9)

(3) පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

1. දරුවෙක් - ..................

2. නටයි - ..................

3. ලියති - .................. (ල. 9)

(4) පහත සඳහන් පද අයත් ව්‍යාකරණ වර්ගය කුමක්දැයි ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

1. බලවයි - .............................

2. දක්වා - .............................

3. නෙළුම් මල - ............................ (ල. 9)

(5) පහත සඳහන් පදවලට සමානාර්ථ හා විරුද්ධාර්ථ පදය බැගින් ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

1. මිතුරා ............................ ...............................

2. ප්‍රසිද්ධ ........................... ................................

3. පිරිසිදු ......................... ................................ (ල. 12)

(6) මෙම වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

1. අපි යහපත් වැඩ කරමු

2. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා දරුවන් ඇමතුවේ ය. (ල. 10)

(7) හිස් තැනට යෝග්‍ය පද යොදා පහත සඳහන් රූඪී හා ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

1.අඟුරු ............................ සේදුවත් සුදු නොවේ.

2.කොරේ පිටට .................... .

3.පය බරවායට .......................... කර බෙහෙත් බැන්දා වගේ.

4.පිරුණු .................. දිය නොසැලේ.

5.තටු .................... පක්ෂියා වගේ. (ල. 15)

(8) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ව්‍යාකරණානුකූල ව නිදොස් කර නැවත ලියන්න.

1. ශිෂ්‍යාවෝ ගී ගයන්නේ ය.

2. අප යහපත් වැඩ කරමු.

3. කුරුල්ලෙකු ඉහළ අහසේ පියාසර කරයි. (ල. 9)

## 11 කොටස

(9) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මානවයා වර්ගයා සතු විශිෂ්ට ම හැකියාව භාෂාවක් භාවිතයයි. භාෂාවක් නොතිබුණා නම් අතීත තොරතුරු වර්තමානය කරා ගලා ඒම කිසි සේත් සිදු නො විය හැකි ව තිබුණි . බොහෝ භාෂාවල කථන හා ලිඛිත වශයෙන් කොටස් දෙකක් ඇත . ලිඛිත භාෂාවට ව්‍යාකරණ අනිවාර්ය අංගයකි . සිංහල ව්‍යාකරණ හැදෑරීමට දැනට රචනා වී ඇති පොත් අතරින් පැරණි ම ග්‍රන්ථය සිදත් සඟරාවයි.

1. මෙහි සඳහන් වන මානවයා සතු සුවිශේෂ හැකියාව කුමක් ද?

2. භාෂාවක ඇති කොටස් දෙක කුමක් ද?

3. ලිඛිත භාෂාව ඇති මූලික අංගය කුමක් ද? (ල. 9)

(10) පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මනකල් හද විල් තලයෙහි

පිපි නිවහල් මල්

රටට පිපෙන මල් අපි වෙමු

පුංචි කැකුළු මල්

විලට පිපිණු මල් විල මැද

නිල් මහනෙල් මල්

වැලට පිපිණු මල් වැල මත

කුන්ද සමන් මල්

ගුමු ගුමු ගීයට මිහිලොල්

නැළවෙන වන මල්

ගෙලට බැඳෙන මල්

ලක් මව රුව සරසන මල්

1 .මෙහි පුංචි කැකුළු මල් යන්නෙහි අදහස ලියන්න.

2. මෙහි විලේ සහ වැලේ පිපිණු මල් වර්ග දෙක පිළිවෙළින් ලියන්න.

3. මෙම වචනවලට සමාන පද ගීතයෙන් උපුටා දක්වන්න.

1. මී මැස්සෝ - ....................

2. නිදහස - ....................

3. සිත්කලු - .................. (ල. 9)